## උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2017

-----------------------------------------------

උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5428 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 11 (ආ) (3) වගන්තිය සහ 2016 ජූලි 20 දින එළඹි අංක 5800 - එල්කේ දරන අතිරේක මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම් අනුව, එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කලාපවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කළ යුතු සහභාගීත්ව නගර කලාප ලෙස මහනුවර හා ගාල්ල නගර තෝරා ගෙන තිබුණි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,162.48 කට සමාන විගැහි (SDR) මිලියන 95 (එ.ජ.ඩො මිලියන 192.08) ක් වූ අතර ඉන් රු.මිලියන 19,257 කට සමාන එ.ජ.ඩො මිලියන 147 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. එසේම, 2016 ජූලි 20 දිනැති අංක 5800 - එල්කේ දරන අතිරේක මූල්‍යයනය සඳහා වූ මූල්‍ය ගිවිසුම අනුව, රු.මිලියන 7,975 කට සමාන විගැහි (SDR) මිලියන 39.90 ක් (එ.ජ.ඩො මිලියන 65) යාපනය නගරය සංවර්ධනය සඳහා වෙන්කර තිබුණු අතර ඉන් රු.මිලියන 8,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 55 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය. අතිරේක මූල්‍යයන පහසුකම් යටතේ යාපනය නගරය සංවර්ධනය කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඔ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 මතය

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් රු.මිලියන 59 ක රඳවාගත් මුදල් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ආ) අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් අයකරගත යුතු රු.මිලියන 12.8 ක් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු අත්හිටුවන ලද කොන්ත්‍රාත්කරුවෙකු වෙත මුදාහරින ලද රු.මිලියන 109 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ව්‍යාපෘතිය මඟින් ප්‍රාග්ධනිත කර තිබුණි. මෙම නිසා ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම් ඉහත සඳහන් වටිනාකම්වලින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 10 වගන්තිය ප්‍රකාරව මධ්‍ය ප්‍රතිඵල දර්ශක ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 33 (ඊ) ඡේදයේ සඳහන් ප්‍රසම්පාදන කාර්යසාධන දර්ශකයන් පදනම් කරගෙන ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 24 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාලන අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අංක 01/2016 හා 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.1 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ගිවිසුමේ සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සඳහන් නියමයන්ට අනුකූලව උපදේශකයන් බඳවා ගත යුතුය. එසේ වුවත්, ඉහත නියමයන් අනුගමනය නොකර උපදේශකයන් 11 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඔවුන්ගේ දීමනා ලෙස එකතුව රු.මිලියන 36 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ජා.සං.සං | | | | | | | |
| 5428 එල්කේ | 147.00 | 19,257.00 | 2,614.00 | 11.95 | 1,823.49 | 22.87 | 3,387.00 |
| 5800 එල්කේ | 55.00 | 8,250.00 | 335.00 | 0.29 | 44.72 | 0.29 | 44.72 |
| ශ්‍රී.ලං.ජ. | 55.08 | 7,405.48 | 505.00 | 3.29 | 502.51 | 7.38 | 1,098.67 |
| එකතුව | 257.08 | 34,912.48 | 3,454.00 | 15.53 | 2,370.72 | 30.54 | 4,530.39 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 27,507 කට සමාන එජඩො මිලියන 202 ක මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ

කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 03 ½ ක් ඉකුත් වූ පසු 2017 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 11 ක් නියෝජනය වන රු.මිලියන 3,431.72 කට සමාන එජඩො මිලියන 23.16 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතුකර දක්වමින් නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකීම් පවරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම නිසා වෙන්කරන ලද අරමුදල් උපයෝජනය පහළ මට්ටමක පැවතුණි.

(ආ) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලේ 11 ඡේදය පරිදි ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ඇස්තමේන්තුවේ කරන ලද රු.මිලියන 3,454 ක වෙන් කිරීමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2,370 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කාර්යයන් සඳහා විධිමත් සැලැස්මක් නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී යාපනය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 335 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.17 ක මුදලින් රු.මිලියන 44.72 කට සමාන එ.ජ.ඩො.මිලියන 0.29 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට වැයකර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

ලබාගත් තොරතුරුවලට අනුව, මහනුවර හා ගාල්ල නගරවල තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය ආරම්භයේ සිටම කටයුතු කර තිබුණි. අතිරේක මූල්‍යයන වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ යාපනය නගරය සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි. ප්‍රගති වාර්තා අනුව, ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් වැඩවල අඩු ප්‍රගතියක් වාර්තා කිරීම පොදු ලක්ෂණයක් වූ අතර කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍යමය ශක්‍යතාවය ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම, කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාණවත් නොවන කාර්මික නිලධාරීන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීම, සැලසුම් උපදේශකවරුන් පිළියෙල කළ සැලසුම්වල පැවති දෝෂ, ව්‍යාපෘතිය මඟින් උපදෙස් ලබාදීමේ ප්‍රමාදයන් යනාදී අඩුපාඩු කොන්ත්‍රාත් වැඩවල දුර්වල කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් දිස්ත්‍රික් පදනම මත සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම, අදාළ මහ නගර සභා, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියෝජිතයන් ඉහත සඳහන් කමිටුවට ස්ථිර පදනම මත පත්කර නොතිබුණි. එබැවින් ඉහත සඳහන් නියෝජිතායතන අතර වගකීම් බෙදාහැරීම මඟින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පහසු කරගැනීම සඳහා කමිටු රැස්වීම්වලදී ඵලදායී තීරණයන් ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) මහනුවර, ගාල්ල සහ යාපනය යන නගරවල පුනරුත්ථාපන වැඩකටයුතුවලට අදාල කොන්ත්‍රාත් 87 ක් රු.මිලියන 19,623 කට සමාන එ.ජ.ඩො.මිලියන 131 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනැමීමට සැලසුම් කර තිබුණි. නමුත් මෙයින් රු.මිලියන 8,289 කට සමාන එ.ජ.ඩො. මිලියන 55.34 ක් වටිනා කොන්ත්‍රාත් 34 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට පිරිනමා තිබුණි. උප ව්‍යාපෘති 25 ක කටයුතු යටතේ රු.මිලියන 1,065 ක

පිරිවැයකට පිරිනමා තිබුණු කොන්ත්‍රාත්වල වැඩකටයුතු වැඩ සැලැස්ම අනුව ආරම්භ කර නොතිබුණි. තවද, කටුගස්තොට, මඩවල-දිගන යන මාර්ග නැවත ඉදිකිරීමේ කොන්ත්‍රාත් වැඩ, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 සැප්තැම්බර් 06 දින නවතා තිබුණි. මහනුවර ධර්මාශෝක මාර්ගය නැවත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණවත් නොවන ධාරිතාවයන් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට වැඩ ආරම්භ කර මාස 18 ක් ගතවී තිබුණද සියයට 10 ක පහල ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. මෙයට අමතරව, මහනුවර මැද ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත් 02 ක් රු.මිලියන 631 කට පිරිනමා තිබුණද, වැඩ සැලසුම්වලට කරන ලද වෙනස්කම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 29 ක පහල ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. අවශ්‍ය ප්‍රදාන පුද්ගලයන් නොවීම හා කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය උපකරණ යොදවා නොතිබීම හේතුකොටගෙන රු.මිලියන 855 ක පිරිවැයක් යටතේ කරගෙන ගිය මොරගොඩ ඇල ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩකටයුතුවල අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 22 සමඟ සැසදීමේදී සියයට 5 ක පහල ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනුවර ධර්මාශෝක මාවත සහ කටුගස්තොට-මඩවල දිගන මාර්ගය යන කොන්ත්‍රාත් 02 හි ඉංජිනේරු ඇස්තමේන්තුව පිළිවෙලින් රු.මිලියන 911 ක් හා රු.මිලියන 2,156 ක් වුවද එම කොන්ත්‍රාත් පිරිනමා තිබුණු වටිනාකම පිළිවෙලින් රු.මිලියන 727 ක් හා රු.මිලියන 1,615 ක් විය. මේ අනුව කොන්ත්‍රාත්වල ඇස්තමේන්තුගත පිරිවැය හා කොන්ත්‍රාත් පිරිනැමූ වටිනාකම් අතර කැපීපෙනෙන විචලනයන් නිරීක්ෂණය විය. එසේ වුවත් මෙම විචලනයට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. තවද, කොන්ත්‍රාත්කරුවන් වෙත මුදාහැර තිබුණු එකතුව රු.මිලියන 351 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, සමාලෝචිත වර්ෂයේ සියයට 30 ක පහල ප්‍රගතිය හේතුවෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට පෙර හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය ලබාදීමට පෙර, මහනුවර නගරසභා රථගාල වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ රු.මිලියන 49 ක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස නිදහස් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේ වුවත්, කොන්ත්‍රාත් වැඩ කටයුතු 2018 අප්‍රේල් 30 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. එසේම, කොන්ත්‍රාත් වැඩ කටයුතු කරගෙන යාමේ සැලැස්මක්, කොන්ත්‍රාත් වැඩ සටහනක් හා ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රකාශයක් ලබා ගැනීමකින් තොරව සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමෙහි දෙවන වාරිකය නිදහස් කිරීම සඳහා ලගාකර ගැනීමට අපේක්ෂිත කාර්යසාධනය සැලකිල්ලට නොගෙන මහනුවර වොම්ලින් උද්‍යානය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 58.82 ක් වාරික 2 කින් නිදහස් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් නොතිබීම හේතුවෙන් එ.ජ.ඩො. මිලියන 44.33 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ සමාලෝචිත වර්ෂයේදී නිමකළ යුතුව තිබුණු ප්‍රසම්පාදන කටයුතු 105 ක් ආරම්භ කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

(ඈ) ගැටඹේ ජලපිරිපහදු යන්ත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 899 කට ප්‍රදානය කිරීමෙන් අනතුරුව, තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ යෝග්‍යතාවය සහ සුදුසුකම් පිළිබඳව වූ ගැටලු සම්බන්ධයෙන් ලැබී තිබුණු පැමිණිලි හේතුකොටගෙන නැවත ලංසු කැඳවීමට ප්‍රසම්පාදන අභියාචනා කමිටුව තීරණය කර තිබුණි. මෙම නිසා මෙම කාර්යය සඳහා වෙන්කර තිබුණු මූල්‍ය පහසුකම් ණය ලබාදෙන නියෝජිතායතනය විසින් කපා හැර තිබුණි.

(ඉ) රු.මිලියන 950 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ මහනුවර නගරයේ වර්ෂා ජලය බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2015 වර්ෂයේ ආරම්භ කර තිබුණද, එය 2017 දෙසැම්බර් 21 දින දක්වාම අවසන් කර නොතිබුණි. එසේ වුවත්, ප්‍රමාදයට හේතුන් විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනුවර මැද ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා වන වැඩ සැලසුම් හා වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම උපදේශකවරුන් විසින් සිදුකර නොතිබීම හේතුවෙන් එම කටයුතු සඳහා මූලික අධ්‍යයනයක් සිදු කිරීම හෝ එකඟ වූ වෘත්තීය ප්‍රමිතීන් අනුගමනය කිරීම හෝ සිදුකර නොතිබුණි. එසේම, උපදේශකවරුන් විසින් මූලික අධ්‍යයනයක් සිදු කිරීමෙන් තොරව අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා රු.මිලියන 53 ක අතිරේක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවීමට ව්‍යාපෘතියට සිදුවී තිබුණි.

(ආ) මහනුවර ටොම්ලින් උද්‍යානය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල මූලික නිර්මාණ සැලසුම්වල අඩුපාඩු හේතුවෙන් රු.මිලියන 27 ක් අතිරේකව වැය කිරීමට ව්‍යාපෘතියට සිදුවී තිබුණු අතර කොන්ත්‍රාත් කාලයද මාස 3 ½ කින් දීර්ඝ කිරීමට සිදුවී තිබුණි.

## 3.5 මූල්‍ය පාලනය හා සම්බන්ධ ගැටලු

----------------------------------

2017 ජනවාරි 01 දිනට පැවති රු.මිලියන 1,326 කට සමාන එ.ජ.ඩො. මිලියන 8.84 ක් වූ ශේෂය සහ 2017 අප්‍රේල් හා ජුනි මාසවල ලබාගත් රු.මිලියන 1,163 කට සමාන එ.ජ.ඩො. මිලියන 7.65 ක අග්‍රිමයද ඇතුලත් රු.මිලියන 2,473.50 කට සමාන එ.ජ.ඩො. මිලියන 16.49 ක මුදලින් රු.මිලියන 1,869 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 12.23 ක් පමණක් ව්‍යාපෘතියෙහි විශේෂ (ඩොලර්) ගිණුමෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. මෙම නිසා ව්‍යාපෘතියෙහි වැඩකටයුතුවල අඩු ප්‍රගතිය සහ මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳව කරන ලද දුර්වල පුරෝකතනයන් හේතුවෙන් රු.මිලියන 634.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.26 ක මුදලක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව මාස 6 කට වැඩි කාලයක් ගිණුමේ රඳවා තිබුණි.

## 3.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් රථ කුලී පදනම මත ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් අත්සන් කර තිබුණු ගිවිසුමට අනුව, මාසයකට උපරිම වශයෙන් කිලෝ මීටර් 2,500 ක් ධාවනය කළ යුතු අතර ඊට වැඩිවන කිලෝ මීටර් ප්‍රමාණය සඳහා අතිරේක ගාස්තුවක් ගෙවිය යුතු වේ. ඇතැම් වාහන උපරිම වශයෙන් ධාවනය කළ හැකි දුර ප්‍රමාණයට වඩා කිලෝ මීටර් 75,249 ක් අඩුවෙන් ධාවනය කර තිබියදී, වැඩිපුර ධාවනය කළ කිලෝ මීටර් 133,841 ක් වෙනුවෙන්ද ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 7.15 ක් වැයකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ගාල්ල කොටුපවුර ප්‍රතිසංස්කරණය කිරීමේ වාර්තාව මූලික විමර්ශනයක් හා පරිසර බලපෑම් පිළිබඳ ඇගයීමක් සිදු නොකර උපදේශකයන් විසින් පිළියෙල කර තිබීම නිසා ඒ හා සමාන අධ්‍යයනයක් පසුව කිරීමට සිදුවී තිබුණි. මෙම නිසා පළමු අධ්‍යයනය සිදු කළ උපදේශකවරුන්ට ගෙවා තිබුණු රු.මිලියන 60 ක මුදල ඵලරහිත වියදමක් බවට පත්ව තිබුණි.

**3.7** **ඌන උපයෝජිත වත්කම්**

**------------------------------**

ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 195 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු යන්ත්‍ර හා උපකරණ මහනුවර හා ගාල්ල මහානගර සභාවලට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදී තිබුණු නමුත් එම වත්කම් උපයෝජනය කිරීමේ සැලැස්මක් නොතිබීම නිසා අදාල අරමුණු සඳහා භාවිතා කිරීමකින් තොරව වත්කම් භාරදුන් ආයතන පරිශ්‍රයන්හි 2018 අප්‍රේල් 30 දක්වාම රඳවා තිබුණි. තවද, රු.මිලියන 120 ක පිරිවැයකට 2016 වර්ෂයේදී මිලටගෙන තිබුණු ජලනල හා උපාංග තොගයක් 2018 අප්‍රේල් අවසානය දක්වා භාවිතයට නොගෙන ජල සම්පාදන හා ජලපවහන මණ්ඩල භූමියෙහි නිෂ්කාර්යව රඳවා තිබුණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 13 කට අයත් 158 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත වුවද, අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ඇතුළුව ප්‍රධාන තනතුරු 07 ක්ද ඇතුළත් පුරප්පාඩු 64 ක් පිරවීමට වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එසේම, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු 14 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 02 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි. ඉහත සඳහන් කළ තනතුරුවල ඌණතාවයන් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ පහළ මට්ටමක ප්‍රගතිය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) එසේම, අංක 01/2016 හා 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි නියමකර ඇති පාරිසරික කාර්යයන් මෙහෙයවීම සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු ව්‍යාපෘතිය මඟින් සේවයෙහි යොදවා තිබුණි. තවද, කොන්ත්‍රාත් කළමනාකරණ ගැටලු විසදීම සඳහා සහ ව්‍යාපෘතියේ කටයුතුවලින් බලපෑම් ඇතිකරන පුද්ගලයන් සමායෝජනය කිරීම සඳහා නියමිත සුදුසුකම් සහිත පුද්ගලයන් සමාජ ආරක්ෂක අරමුණින් යුතුව බඳවාගෙන නොතිබුණි.

**3.9** **ඉඩම් අත්පත්කර ගැනීම**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් අත්පත්කර ගැනීම සඳහා වූ එකතුව රු.මිලියන 274.8 ක වන්දි මුදලින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු වූ රු.මිලියන 98.6 ක් පමණක් ව්‍යවස්ථාපිත ගෙවීම් ලෙස ගෙවා තිබුණි. ඉතිරි රු.මිලියන 176.2 ක මුදල ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීම් කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන ගෙවා තිබුණි. එසේම, සහනදායී පදනම මත වන්දි ලැබී තිබුණු මෙම ඉඩම් හිමියන්ටම එකතුව රු.මිලියන 172 ක අතිරේකව ගෙවීමට හේතුවූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ආ) යාපනය නාගරික ප්‍රදේශය තුළ පිහිටි මාර්ග 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය තුලදී ඉඩම් කට්ටි 332 අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, කිසිදු ඉඩම් කට්ටියක් අත්පත් කරගෙන නොතිබුණි.